# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

## 2008 අංක 18 දරන ශ්‍රී රත්නජෝති ප්‍රජා සංවර්ධන සහ සමාජයීය පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2008 මාර්තු මස 26 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

2008 මාර්තු මස 28 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 6.00 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

## 2008 අංක 18 දරන ශ්‍රී රත්නජෝති ප්‍රජා සංවර්ධන සහ සමාජයීය පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2008 මාර්තු මස 26 වන දින]

එල්. ඩී.—ඕ. (ඉන්) 13/2006.

ශ්‍රී රත්නජෝති ප්‍රජා සංවර්ධන සහ සමාජයීය පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

“ශ්‍රී රත්නජෝති ප්‍රජා සංවර්ධන සහ සමාජයීය පදනම” යනුවෙන් සඳහන් කරනු ලබන සහ හඳුන්වනු ලබන පදනමක්, ඒ පදනමේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව, එකී පදනමට සම්බන්ධ සියලු පරමාර්ථ හා කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබුණු හෙයින් ද : — පූර්විකාව.

එකී පදනම පිහිටුවන ලද්දේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද එකී පරමාර්ථ හා කාරණා එකී පදනම විසින් මේ දක්වා සාර්ථකව ක්‍රියාත්මක කරනු ලැබ හා ඉටු කරනු ලැබ ඇති හෙයින් ද ; ඒ පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් සහ ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2008 අංක 18 දරන ශ්‍රී රත්නජෝති ප්‍රජා සංවර්ධන සහ සමාජයීය පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දින සිට සහ ඉන් පසුව ශ්‍රී රත්නජෝති ප්‍රජා සංවර්ධන සහ සමාජයීය පදනමේ දැනට සාමාජිකයන්ව සිටින සෑම තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් “ශ්‍රී රත්නජෝති ප්‍රජා සංවර්ධන සහ සමාජයීය පදනම” යන නාමය සහ අනුප්‍රාප්තිය සහිත අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු “සංස්ථාව” යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් විය යුතු අතර, එකී සංස්ථාපිත නාමයෙන්, ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීම සහ එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරිය ඒ සංස්ථාවට ඇත්තේ ය. — ශ්‍රී රත්නජෝති ප්‍රජා සංවර්ධන සහ සමාජයීය පදනම සංස්ථාගත කිරීම.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි, මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:— — සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) ප්‍රජාවගේ සදාචාර පදනම දියුණු කිරීම සහ මේ සම්බන්ධයෙන් අදාළ පියවර අනුගමනය කිරීම;

2-PL 002353-2,750 (2007/08)

(ආ) පෙර පාසල්, දිවා සුරැකුම් මධ්‍යස්ථාන, ළමා නිවාස, සහ ළමා අධ්‍යාපනය සම්බන්ධයෙන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම;

(ඇ) දුප්පත්කම හෝ ආබාධිත වීම හේතුවෙන් අධ්‍යාපන කටයුතු කරගෙන යාමට අපොහොසත් ශ්‍රී ලාංකික ශිෂ්‍යයන්ගේ සුභසාධනය සහ ප්‍රතිලාභ නංවාලීම පිණිස හැකි කවර වුව ද ආකාරයකින් ආධාර කිරීම;

(ඈ) අධ්‍යාපනයේ ප්‍රගතිය වර්ධනය කිරීමෙහි ලා අවශ්‍ය පුස්තකාල පිහිටුවීම, පන්ති, දේශන, සම්මේලන, සම්මන්ත්‍රණ, වැඩමුළු, සාකච්ඡා, වාද විවාද, අධ්‍යාපන චාරිකා හා ප්‍රදර්ශන සංවිධානය කිරීම හා පුවත්පත් සඟරා ආදිය පළ කිරීම;

(ඉ) දිළිඳු, මහළු, සහ අසරණ තැනැත්තන් ද කායික හා මානසික දුබලතා ඇති තැනැත්තන් ද වෙනුවෙන් නිවාස සැපයීම ආදිය සහ වෙනත් අත්‍යාවශ්‍ය පහසුකම් සැපයීම මගින් පිහිටවීම;

(ඊ) තරුණ පරපුර ඵලදායී සේවාවල යෙදවීම සඳහා භාෂා පුහුණු හා වෘත්තිය පුහුණු පාඨමාලා ඇරඹීම;

(උ) ආදායම් උපදවන ක්‍රියාකාරකම්වලට සම්බන්ධවීමට තරුණ පරපුරට පහසුකම් සැලසීම සහ මවුන්ට ඒ සඳහා අවශ්‍ය ආධාර ලබාදීම නොකඩවා කරගෙන යාම;

(ඌ) ප්‍රජාවගේ සුභසාධනයට අදාල වන ආකාරයට ළමා සෞඛ්‍ය, වැඩිහිටි සෞඛ්‍ය, රෝග බෝවීම වැළැක්වීම, පෝෂණ, ව්‍යායාම, ක්‍රීඩා, වෛද්‍යාධාර ආදී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම;

(එ) විශේෂයෙන් අඩු ආදායම් ලබන ජන කොටස් අතර, සමාජ සංවර්ධන කටයුතු උදෙසා ශ්‍රමදාන හා සමාන ස්වේච්ඡා සේවා සැපයීම සහ මේ සම්බන්ධයෙන් ආදර්ශ ව්‍යාපෘති ආරම්භ කර පවත්වාගෙන යාම;

(ඒ) විධිමත් රැකියාවක් නැති තැනැත්තන්ට යම් කර්මාන්තයකට හෝ වෙළෙඳාමකට සම්බන්ධ වීමට සහාය වීම හෝ කෘෂිකාර්මික, කාර්මික හෝ වාණිජමය ව්‍යාපාර ආරම්භ කිරීමට සහ නවීන තාක්ෂණික උපකරණ භාවිතා කිරීමට ඔවුන්ට සහායවීම පිණිස පුහුණු වැඩ සටහන් සහ ප්‍රචාරක කටයුතු සංවිධානය කිරීම;

(ඔ) සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති වෙනත් දේශීය හෝ විදේශීය ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, බැංකු ගිණුම් ආරම්භ කිරීම, ක්‍රියාත්මක කිරීම හා වැසීම, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබාගැනීම, ප්‍රදාන සහ පරිත්‍යාග පිළිගැනීම හෝ එකතු කිරීම, සංස්ථාවේ අරමුදල් ආයෝජනයේ යෙදවීම සහ සංස්ථාවේ පරමාර්ථ ඉටුකිරීම සඳහා අවශ්‍ය නිලධරයන් හා සේවකයන් සේවයට බඳවා ගැනීම, සේවයේ නියුක්ත කිරීම හා සේවයෙන් පහ කිරීම ඇතුළුව, සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ ඉන් යම් පරමාර්ථයක් හෝ ඉටුකර ගැනීම හෝ ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර වූ හෝ සියලු ක්‍රියා කාරණා සහ දේ කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය.

5. (1) සංස්ථාවේ කටයුතු, 6 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත්ව, එකී රීතිවලට අනුකූලව තෝරා පත්කර ගනු ලබන්නා වූ සභාපති, උපසභාපතිවරුන් දෙදෙනකු, ලේකම්, භාණ්ඩාගාරික, විගණකවරයකු සහ වෙනත් සාමාජිකයන් අටදෙනකුගෙන්ද සමන්විත වූ අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් පරිපාලනය කළ යුතු ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ පටහැනිව කුමක් සඳහන් වූව ද, කුලි/දියකඩිමුල්ල ශ්‍රීපති පිරිවෙණේ නායක ස්වාමීන් වහන්සේ හෝ තේවායික භික්ෂූන් වහන්සේ නමක් ඒ ධුරයෙන් එතුමන් ඉවත් වන තෙක් හෝ ධුරය හිස්කරන තෙක් සංස්ථාවේ සභාපතිවරයා විය යුතු ය.

(3) සංස්ථාවේ ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය, මේ පනත ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ ධුර දරන අධ්‍යක්ෂ මණ්ඩලය විය යුතු ය.

සංස්ථාවේ රීති.

6. (1) සංස්ථාව විසින් කලින් කල, සාමාජිකයන්ගේ මහා සභා රැස්වීමක දී, පැමිණ ඡන්දය දෙන සාමාජිකයන් තුනෙන් දෙකකගේ ඡන්දයෙන් පහත දැක්වෙන කාරණා සියල්ලම හෝ ඉන් යමක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල විය යුතු ය:—

(අ) සාමාජිකයන් වර්ග කිරීම, ඔවුන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ සාමාජිකත්වයෙන් ඔවුන් නෙරපීම;

(ආ) අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් විය යුතු සභාපතිවරයා, උපසභාපතිවරු දෙදෙනා, ලේකම්, භාණ්ඩාගාරික, විගණකවරයා, සහ වෙනත් විධායක කාරක සහ සාමාජිකයන් අටදෙනකු කාරක සභිකයන් ලෙස තෝරා පත් කර ගැනීම;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, චර්යාව, කාර්යයන් සහ කර්තව්‍යයන් ;

(ඈ) පහළවේ රැස්වීම්වල දී අනුගමනය කලයුතු කාර්ය පටිපාටිය, අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම, එවැනි රැස්වීම් පවත්වන වේලාව, ස්ථානය සහ ඒ රැස්වීම් පිළිබඳ දැන්වීම්, න්‍යායපත්‍ර සහ රැස්වීම් සඳහා ගණපූරණය සහ රැස්වීම්වල කටයුතු ;

(ඉ) සංස්ථාවේ දේපළ පාලනය සහ කළමනාකරණය, එහි අරමුදල්වල භාරකාරත්වය සහ එහි ගිණුම් පවත්වාගෙන යාම හා විගණනය ;

(ඊ) පොදුවේ සංස්ථාවේ කටයුතු කළමනාකරණය සහ එහි අරමුණු මුදුන් පමුණුවා ගැනීම.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් රීතියක් සාදනු ලබන ආකාරයෙන් ම සංස්ථාමේ යම් රීතියක් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, රීට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සාමාජික ලේඛනය.

7. සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වූ දිනයේ දී සංස්ථාවේ සාමාජිකයකුව සිටින සෑම තැනැත්තකුගේ ම සහ ඉන් පසුව සංස්ථාවේ සාමාජිකයකු ලෙස යථා පරිදි ඇතුළත් කර ගන්නා සෑම තැනැත්තකුගේ ම නම, ලිපිනය සහ සංස්ථාවේ රීති යටතේ නියම කරනු ලැබිය හැකි වෙනත් යම් තොරතුරු ද සටහන් කර තබනු ලැබිය යුතු ලේඛනයක් පවත්වා ගැනීමට සැලැස්විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

8. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ වෙනුවෙන් ත්‍යාග, රික්ථවරණ, පරිත්‍යාග, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් මෙතෙක් කල් ලැබී තිබුණු හෝ මින් මතු ලැබෙන සියලු

මුදල්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරන ලද වියදම් කිසිවක් පියවීමට අවශ්‍ය සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ ගිණුම්.

9. සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, සංස්ථාවට ලැබුණු සහ සංස්ථාව විසින් වියදම් කරනු ලැබූ සියලු ම මුදල් පිළිබඳව නිසි අයුරින් ගිණුම් තැබීමට සැළැස්විය යුතු අතර, යටත් පිරිසෙයින්, වර්ෂයකට එක් වරක් හෝ සංස්ථාවේ ගිණුම් පරීක්ෂා කොට සහ විගණනය කොට ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සාමාජිකයකු හෝ සාමාජිකයන් වන්නා වූ විගණකවරයකු හෝ විගණකවරුන් වැඩි ගණනක් හෝ විසින් සහතික කළ යුතු ය.

පදනම විසින් සහ පදනමට ගෙවිය යුතු මුදල්.

10 මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවෙහි පදනමේ පැවති සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලැබූ සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට පදනමට අයවිය යුතු ණය සහ ගෙවිය යුතු සාමාජික මුදල් සහ දායක මුදල්, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

මුදල් හා දේපළ අදාළ කර ගැනීම.

11. කවරාකාරයකින් හෝ සංස්ථාවට ලැබුණු මුදල් සහ දේපළ මෙහි දක්වා ඇති පරිදි හුදෙක් සංස්ථාවේ පරමාර්ථ වැඩිදියුණු කිරීම සඳහා යොදවනු ලැබිය යුතු අතර, ඉන් කිසිදු කොටසක් ලාභාංශ, ප්‍රසාද දීමනා, ලාභ හෝ වෙනත් කවරාකාරයකින් හෝ සංස්ථාවේ සාමාජිකයන්ට සෘජුව හෝ වක්‍රව ගෙවීම හෝ පැවරීම හෝ කරනු නොලැබිය යුතු ය.

සංගමය විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

12. යම් මිළට ගැනීමකින්, ප්‍රදානයකින්, තෑගි කිරීමකින් පොස්තමේන්තු නියාදනයකින් හෝ අන්‍යාකාරයකින් සංස්ථාව සතු වන යම් චංචල හෝ නිශ්චල දේපළක් ගැනීමට හා දැරීමට, නීතියෙන් සංස්ථාවට බලය හා හැකියාව ඇති අතර, ඒවා විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව 6 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත්ව මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් දැරිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

13. සංස්ථාවේ මුද්‍රාව, සභාපතිවරයා සහ ලේකම්වරයා හෝ භාණ්ඩාගාරික ඉදිරිපිට දී හැර කවර වූ හෝ සාධන පත්‍රයකට නොතැබිය

යුතු අතර, තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය ; තව ද, එකී අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

සාමාජිකයන්ගේ වගකීම.

14. සංස්ථාවේ කිසිම සාමාජිකයෙක් සංස්ථාවේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා ඔහුගෙන් සංස්ථාවට අයවිය යුතු දායක මුදල් ප්‍රමාණය, තත්කාලය සඳහා ඒ සාමාජිකයාගේ වසරක සමාජික මුදල් ප්‍රමාණය ඉක්මවන පරිදි දායක වීමට යටත් නොවන්නේ ය.

විසුරුවා හැරීම හෝ ගණන් බේරා වසා දැමීම.

15. සංස්ථාව විසුරුවා හැරීමක දී හෝ ගණන් බේරා වසා දැමීමක දී එහි සියලු ණය, බැරකම් හා බාහිර ගෙවීම් පියවීමෙන් පසුව යම් දේපළක් ඉතිරිව ඇත්නම්, ඒ දේපළ, සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදාහරිනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ අරමුණුවලට සමාන අරමුණු ඇත්තා වූද ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් සිය සාමාජිකයන් අතර බෙදා හැරීම තහනම්ව ඇත්තා වූ ද, යම් ආයතනයකට හෝ ආයතනවලට, සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අභිමතය පරිදි, දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. ඒ දේපළ හෝ ඉන් යම් කොටසක් හෝ මේ වගන්තියේ මීට ඉහතින් ඇති විධිවිධානවලට අනුකූලව බෙදා හැර කරනු ලැබිය නොහැකි නම්, ඒ දේපළ හෝ දේපළින් කොටස සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් පුණ්‍යාධාර කටයුත්තක් සඳහා යොදනු ලැබිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

16. ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

17. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹෙන එක් එක් වර්ෂය සඳහා එය ලබාගත හැකි ය.